ගලිගමුව ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2016 ජුනි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

(අ) 2012 හා 2013 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ පරිදි සමාලෝචිත වර්ෂයේදී ඉවත් කරන ලද රු.256,626 ක් වූ ලී බඩු හා උපකරණ වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට ගැලපීම් නොකර සමුච්චිත අරමුදලට හර කිරීම නිසා ප්‍රාග්ධන යෙදුමට ආදායයෙන් දායක වීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් අක්කර 13 පර්.95 කින් යුත් ඉඩම් කොටස් 15 ක හා භූමි ප්‍රමාණය සඳහන් නොවූ ඉඩම් කොටස් 05 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් වල අගය නිවැරදිව දක්වා නොතිබුණි.

(ඇ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ උපලේඛනයට අනුව වටිනාකම සඳහන් නොවූ අයිතම 93 ක ඒකක 763 ක්වූ අතර වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම් අගය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ලීබඩු හා සවිකිරීම් උප ලේඛනයට අනුව අයිතම 22 ක ඒකක 34 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම් වල අගය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වියදම් ණය හිමියෝ රු.12,563,995 ක් ලෙස දක්වා ඇතත් ගෙවූ වවුචර් අනුව රු.65,767 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) වත්කම් සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර ඇතත් මුලා ප්‍රකාශන වල ක්ෂය වෙන් කිරීම් ගිණුමක් පෙන්වා නොතිබුණි.

(උ) පුස්තකාල පොත් සඳහා ක්ෂය සිදුකර නොතිබුණ අතර 2015 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු.272,472 ක් වටිනා පොත් පුස්තකාල පොත් ගිණුම හර කර සමුච්චිත අරමුදල හා ඌනතා ගිණුම බැරකර තිබුණි.

1.3.2 නොසැසඳුනු පාලන ගිණුම

-------------------------------

ගිණුම් විෂයයකට අදාලව මුලා ප්‍රකාශන අනුව ශේෂය රු.1,523,417 වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂය රු.1,663,667 වූයෙන් වෙනස 140,250 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වැඩි කාලයක් ගතවූ අයවිය යුතු සේවක ණය ශේෂය රු.95,000 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,584,402 ක් විය

1.3.4 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත දැක්වෙන නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.396 | මාස 06 ක කාලයක් ඉක්මවූ රු.36,748 ක කල් ඉකුත් වූ චෙක්පත් 34 කට අදාලව යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.571 | එකතුව රු.489,762 ක කල් ඉකුත් වූ තැන්පත් ශේෂ 289 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,954,917 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,148,969 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,194,052 ක පිරිහීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 4,194,052 ක පිරිහීමට ආදායම් විෂයයන් 04 ක අඩුවීම හා වියදම් විෂයයන් 04 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2015ජන01 දිනට හිඟය රු. | 2015දෙසැ31 දිනට හිඟයෙන් අයකිරීම රු | 2015 වර්ෂයේ බිල් කිරීම් රු. | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම රු. | 2015දෙසැ31 දිනට හිඟය: 2015ජන01 දිනට පැවති හිඟයෙන් රු. | 2015දෙසැ31 දිනට හිඟය: වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය රු. | 2015දෙසැ31 දිනට හිඟය: මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|
| i වරිපනම් හා බදු | 542,193 | 346,782 | 1,710,907 | 1,233,347 | 195,411 | 477,560 | 672,971 |
| ii බදුකුලී | 526,646 | 1,500 | 2,416,022 | 2,299,392 | 525,146 | 116,630 | 641,776 |
| iii බලපත්‍ර ගාස්තු | 77,300 | 73,500 | 687,861 | 687,868 | 3,800 | - | 3,800 |
| iv වෙනත් ආදායම් | 9,310,211 | 6,830,074 | 9,957,970 | 2,793,739 | 2,480,137 | 7,164,231 | 9,644,368 |

2.3.2 වරිපනම් හා අක්කර බදු

-----------------------------

වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව එම බද්ද අයවීමට ඇති ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමට හෝ මුදල් අයකර ගැනීම කලයුතු බව දක්වා තිබුණද දීර්ඝ කාලයක සිට බදු අය නොවී පැවතිය ද නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට රු.640,248 ක හිඟයක් පැවතුණි.

2.3.3 දුරකථන සම්ප්‍රේක්ෂණ කුළුණු ගාස්තු

-----------------------------------------

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 16 ක් සඳහා ව්‍යාපාර බදු වශයෙන් රු.48,000 ක ආදායමක් සභාව අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

සබරගමුව පළාත් සභාව හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රා දේශීය සභාවට ලබා දී තිබූ වටිනාකම රු.46,075,650 ක් වූ වාහන, යන්ත්‍ර සූත්‍ර 14 ක් සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) 2014 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළයුතු යටිතල පහසුකම් හඳුනා ගැනීමටත් ඒවා නඩත්තු කිරීමට කටයුතු නොකිරීම නිසා එම ව්‍යාපෘතිය සඳහා ලබාගත හැකිව තිබුණු රු.7,000,000 ක මුදලින් රු.4,000,000 ක් පමණක් ලබාගෙන තිබුණු අතර එයින් වැය කළ මුදල රු. 2,165,274 කි. ඒ අනුව ලබාගත් ප්‍රතිපාදනයෙන්ද රු.1,834,726 ක් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව මඟින් සභා බල ප්‍රදේශයේ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම පිණිස මෙම මූල්‍යමය ප්‍රතිපාදන වලට අමතරව බැකෝ ලෝඩර්, ගලි බවුසර්, ජල බවුසර්, මෝටර් ග්‍රේඩර් ආදී යන්ත්‍රෝපකරණද ලබාදී තිබුණි. එහෙත් ඉටුකරගතයුතු යටිතල පහසුකම් හඳුනා ගැනීමටත් ඉලක්ක සපුරා ගැනීමටත් සභාව අපොහොසත් වී තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

---------------------

(අ) සභාව මඟින් සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගනු ලැබූ සේවකයින් 09 දෙනෙකු සඳහා සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ස්ථිර පත්වීම් ලිපි නිකුත් කිරීමෙන් පසුව ද සේවක අර්ථ සාධක අරමුදලට 12% ක සභා දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදලට 3% ක සභා දායකත්වයක් ද ගෙවීම නිසා සභා අරමුදලට සිදුවූ අලාභය රු. 85,598 කි.

(ආ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජූලි 20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 02/2011 (සංශෝධන) මඟින් පළාත් පාලන ආයතන විසින් බඳවා ගනු ලබන අනියම්, තාවකාලික, ආදේශක,දෛනික වැටුප් ලබන සියළුම සේවකයින් රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායක කර පත්වීම් ප්‍රදානය කළයුතු බවට අවධාරණය කර තිබුණද 2015 වර්ෂය තුල බඳවා ගන්නා ලද සේවකයින් 10 ක් රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායක කර නොගෙන සේවක අර්ථ සාධක අරමුදලට දායක කර ගැනීමෙන් 2015 වර්ෂය තුළදී පමණක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට රු. 49,498 ක දායක මුදලක් ගෙවීමෙන් සභා අරමුදලට අලාභයක් සිදුවී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසාගෙන තිබුණ වැය විෂයයන් 22 ක එකතුව වූ රු.7,097,500 ක ප්‍රතිපාදන 100% ක්ද විෂයයන් 5 ක එකතුව රු.1,466,622 ක ප්‍රතිපාදන වලින් 75% ට වැඩි වශයෙන් ද එකතුව රු.8,564,122 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 මුල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5 (7) ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.3 අක්‍රිය බැරකම්

--------------------

සභාවට අයත් බැංකු ගිණුමක රු.46,582 ක මුදල් ශේෂයක් 2013 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණි

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනsය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය